## පූර්ව විවාහ ලිංගික ක්‍රියාः ශ්‍රී ලංකා සමාජය තුළ පූර්ව විවාහ ලිංගික ක්‍රියා කෙරෙහි සංස්කෘතික බලපෑම


පී.එච්.ආර්. අසිංසලා - සමාජවිද්‍යා අධ්‍යයනාංශය


සියලු සත්වයන්ගේ මූලික අවශ්‍යතාවක් වන ලිංගිකත්වය සමාජ සංස්කෘති තුළ සීමා කිරීම්වලට ලක් කර ඇත. ශ්‍රී ලංකා සමාජය තුළ ලිංගික ක්‍රියා සමාජයීය වශයෙන් අනුමත කරනුයේ විවාහයෙනි. ඒ අනුව විවාහයට පෙර සහ පසු වශයෙන් ලිංගික ක්‍රියා වර්ග කරයි. පූර්ව විවාහ ලිංගික ක්‍රියා පිළිබඳව වර්තමාන සමාජයේ දැකිය හැක්කේ වාද විෂයාත්මක තත්වයකි. මිනිසුන් පූර්ව විවාහ ලිංගික ක්‍රියා සාධනීය තත්වයක් ලෙසත්, නිශේධනීය තත්වයක් ලෙසත් අර්ථකථනය කරගනී. විරුද්ධ ලිංගිකයන් අතර පූර්ව විවාහ ලිංගික සම්බන්ධතා පිළිබඳ තාරුණ්‍යයේ අදහස් කෙරෙහි ලාංකේය සංස්කෘතිය බලපාන්නේ කෙසේද? යන්න මූලික පර්යේෂණ ගැටලුවයි. මෙහි දී අවුː 20 - 30ත් අතර පිරිස තාරුණ්‍යය ලෙස අර්ථකථනය කර ගැනුණි. පර්යේෂණ ක්‍රමවේදය තුළ පර්යේෂණ ක්ෂේත්‍රය වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයයි. නියැදිය වශයෙන් අරමුණු සහගත නියැදිය මගින් ප්‍රතිචාර දක්වන්නන් 13 දෙනෙකු තෝරා ගන්නා ලදි. දත්ත රැස් කිරීමේ ක්‍රමශිල්ප ලෙස සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ක්‍රම මූලිකව යොදා ගැනුණි. මෙහි දී ප්‍රධාන සංස්කෘතිකකාරක වශයෙන් පවුල් පසුබිම, ආගම සහ අධ්‍යාපන සංස්ථාව පූර්ව විවාහ ලිංගික ක්‍රියා සම්බන්ධව තාරුණ්‍යයේ ආකල්ප කෙරෙහි බලපෑම් කර ඇත්තේ කෙසේද යන්න විමසා බලන ලදි. පර්යේෂණ සොයා ගැනීම් වශයෙන් ලිංගික ක්‍රියා යනු පුද්ගල මූලික අවශ්‍යතාවක් හේතුවෙන් එය ප්‍රතික්ෂේප කළ යුත්තක් නොවන බවත්, මූලික අවශ්‍යතාවක් ඉටු කර ගැනීමට ඇති අවස්ථා විවාහයකින් සීමා නොකළ යුතු බවත් දැක්වුණි. එමෙන්ම සංවර්ධනය වෙමින් පවතින, සංස්කෘතික සභ්‍යත්වයක් සහිත රටකට මෙම ක්‍රියා නොගැළපෙන බවත් දැක්වුණි. මෙම ප්‍රතිචාර කෙරෙහි බලපෑම්කාරී වී ඇත්තේ ප්‍රතිචාර දක්වන්නන්ගේ සමාජ පරිසරය බවත් හඳුනා ගන්නා ලදි. ප්‍රතිචාර දක්වන්නන්ගේ අදහස් කෙරෙහි අවිධිමත් අධ්‍යාපනය හා සමාජ පරිසරය බොහෝ බලපෑම් කර ඇත. පූර්ව විවාහ ලිංගික ක්‍රියා තරුණයන් අතර ද මතභේදාත්මක කරුණකි. වර්තමානයේ තාක්ෂණය, ගෝලීයකරණය වැනි විවිධ කාරණා ද එම තත්වය ඇති වීමට හේතු වී ඇත. තරුණයන්ගේ අදහස් හැඩගැස්වීමට මෙම ලාංකේය සංස්කෘතික කරුණු ඍජු හා වක්‍ර ආකාරයෙන් බලපා ඇත. පූර්ව විවාහ ලිංගික ක්‍රියා සම්බන්ධව මෙම මතවාද සමඟ සමාජ සංස්කෘතික කරුණු ලිංගිකත්වය සම්බන්ධ පුද්ගල චර්යා සහ ආකල්ප හැඩගැස්වීමට අඩු-වැඩි වශයෙන් විවිධාකාරයෙන් බලපෑම් කර ඇති බව පර්යේෂණයෙන් හඳුනා ගත හැකි විය.


***ප්‍රමුඛ පදः*** *විවාහය, ලිංගිකත්වය, පූර්ව විවාහ ලිංගික ක්‍රියා, සංස්කෘතිය*